# දිට්වා සහ ටොමියා



W.A.හෙසාරා චිතුමිසා
4 ශ්‍රේණිය E
මහාමායා බාලිකා විද්‍යාලය

# දිට්වා සහ ටොමියා


W.A.හෙසාරා විතුම්සා

4 ශ්‍රේණිය E

මහාමායා බාලිකා විද්‍යාලය



ISBN

918-624-211-454-5

# පිදුම

මා ඉගෙනුම ලබන මහාමායා බාලිකා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ එක සහ දෙක ශ්‍රේණියේ සිප් කිරි පෙවූ දිල්රුක්ෂි ඊශ්වරී ගුරු මෑණියන්ට සහ තුන, හතර ශ්‍රේණියේ සිප් කිරි පොවන දිල්ෂානි ගුරු මෑණියන්ටත් ප්‍රාථමික අංශයේ විදුහල්පති තුමිය ඇතුළු සියලුම ගුරු මෑණියන්ට පියවරුන්ට මේ පොත උපහාරයක්ම වේවා!



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී,අභයකෝන් .එස්.
ආණ්ඩුකාරවර.ම පළාතමධ්‍ය,
සම්මානිත මහාචාර්ය .ලයවවිද්‍යාපේරාදෙණිය විශ් ,
10-05-2026

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටීමාහිත වූ සමබර එවන් පසුබිමක සුස . පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ දළදා සමිඳු සරණින් හේමමාලා ශ්‍රී . යලු කටයුතු සාර්ථක වේවායි ෘතියේ සින්ථකරණ ව්‍යාඋපහාර ග්‍ර .ර්ථනා කරමීමම ප්‍රා

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

## දිට්වා සහ ටොමියා

ජේන තෙක් මානයේ නිල් අහස සමග ගැටෙන කඳු පංතිය, හෙල්මළු ක්‍රමයට වගා කර ඇති වෙල් යාය,උල්පත් වලින් ඇද හැලෙන දිය පහරවල්,ලොකු කුඩා ගස් ආදියෙන් සැදුණු වනපෙත නිසා කාගේත් සිත් ඇදගන්නා සුලු මනරම් පරිසරයක් හිමිකම් කියන සුන්දර ගම්මානයක් වන උඩුදුම්බර මහියංගනය නුවර පාරේ පිහිටා ඇත.



මේ සුන්දර ගම්මානයේ ජීවත්වුණ පුංචි පවුලක් විය.මේ පවුලේ හිටියේ අම්මයි තාත්තායි , අක්කා සහ පුංචි මියුරුයි.

මියුරු ඉගෙන ගත්තේ හතර ශ්‍රේණියේ වන අතර දක්ෂතා රාශියක් තිබූ නිසාවෙන් ගුරු ප්‍රසාදය ඉහළින්ම දිනා ඇත.හොද හැදියාවක් හා කීකරුකමක් ඇති බැවින් කාගේත් සිත් දිනා ගනියි.

තාත්තාගේ රැකියාවෙන් පෙදරේරුවෙක් විය.ඔහු අවංකව, නිවැරදිව තම වෘත්තිය කරන නිසා හැමදාම වගේ වැඩ තිබෙයි.එම නිසා ගෙදර ආර්ථිකය එතරම් අපහසුවක් නැත.

තාත්තා සොයන මුදලට සරිලන පරිදි අම්මා ගෙදර වැඩ පිළිවෙලට සාර්ථකව කළමනාකරණය කරයි.එම නිසා මේ පවුල හරිම සමගියෙන්, සතුටෙන් එන හැම ප්‍රශ්නයක්ම ජය ගනියි.

තාත්තා පවුල වෙනුවෙන් ඉතා වෙහෙස මහන්සි වී වැඩ කරයි. මියුරු සහ අක්කා හොදින් ඉගෙනීම කරති.

චූටි පුතේ.......

ඇයි තාත්තේ......

ආ..... අක්කටත් දෙන්න....

අම්මේ…ඉක්මනට තේ හදන්න.තාත්තා වඩේ ගෙනල්ලා.

අම්මා තේ අරගෙන ආවාය.ගෙදර හැමෝම හරිම සෙනෙහසින් තේ බොන්නට විය.

මල්ලි…..ටොමියට එකක් දෙන්න.

ආ…..ඉජ්ජු…ඉජ්ජු…..ටොමී…වරෙං

නගුට වනාගෙන ටොමියා දුවගෙන ආවේ නිකං.. සාගින්නෙන් වුන්නාක් මෙනි.

තාත්තෙ…මෙයත් දැන් අපේ පවුලෙ කෙනෙක් වගේමයි නේද?

අක්කා ඇසුවේ බල්ලා කෙරේ ඇති දැඩි ආදරය නිසාමයි.

හ්ම්…..ඌ….වැඩියෙ මස්,මාළු කන්නේ නෑ නේද පුතේ….

අනේ…ඔව් තාත්තෙ…

මහ පුදුම සතෙක්…

අපි දෙන්නා ඉස්කෝලෙ ඇරිලා එන වෙලාවට පාරට ඇවිත් මග බලන් ඉන්නවා තාත්තෙ….



අම්මා කිරි ගන්න එළදෙනක් හදා ගන්නා අතර බිත්තර ගැනීමට කිකිළියො තුන් දෙනෙක් ද හදයි.

මල්ලී එළදෙනුන්ට කෑම දීමට හරිම කැමතියි.

පාසල් ඇරී ගෙදර ආ විගස ඇඳුම් ගලවා පසෙකින් තබා දුවගෙන යන්නේ එළදෙනුන් බැද ඇති තැනට යි . තාත්තා කපාගෙන විත් තබා ඇති තණකොල උන්ට දී වතුර බාල්දියක් බොන්නට දීම පුංචි මියුරුගේ අසාවයි.



මෙසේ කාලය ගෙවී යන අතරතුර එක්තරා අඳුරු දිනයක් උදා විය. උදේ අහස කළු පාටට විය. සිරි පොද වැස්ස ආරම්භ විය. කම්මැලිකම ටිකක් දැනුන නිසා මියුරුට පාසල් යාමට අකමැති බව පෙන්නුවා.

අම්මේ...අද නම් වහිනවා.සුළඟත් එනවා. හරිම අඳුරුයි...මට නම් බෑ අද ඉස්කෝලේ යන්න...

අනේ...අනේ.....

අක්කා ලෑස්තිත් වෙලා.ඉක්මනට ලෑස්ති වෙන්න පුතේ...තාත්තා එක්ක ත්‍රීවීල් එකේ යන්න.නැත්නම් ඔයාට පාඩුයි නෙ.

හා..... අම්මේ...

දින ගණනක් එක දිගට වැස්ස තිබුණට එතරම් තද වැස්සක් *නොවීය.*

අද දවසේ නම් වැස්ස වැඩියි නේද අම්මෙ.....

ඔව් පුතේ. ....අද නම් මොරසූරන වැස්සක්...පාරවත් පේන්නේ නෑ......

රෑ බෝ වී ගෙන එන විට අමුතු විදිහට ටොමියා බුරන්නට විය.

නොනවත්වා ටොමියාගේ බිරීම නිසා කලබලයට පත් වූ තාත්තා.....

අද නම් ලොකු විනාශයක් වෙන්න වගේ යන්නේ....

මුළු පරිසරයම වෙනස්....

සුළි කුණාටුවක් වගේ...

මේ ටිකේම වැහැලා කන්දෙ පස් බුරුල් වෙලා තියෙන්නේ.....

අපි ඉක්මනට යමු පන්සලට වත්.....

බල්ලා සමග මුළු පවුලම දුවන්නට ගත්තේ ය.

එයට එකතු වූ මුළු ගමම දුවන්නට විය.



වැඩි වෙලාවක් ගත වූයේ නැත .උඩුදුම්බර කන්දම නාය ගිහින් මුළු ගමම යට විය.

එතන ගමන් තිබුනාද කියලා වත් හිතාගන්නට නොහැකි තරම් සියල්ලම විනාශ විය.

මියුරුලාට ඉතිරි වුයේ ඇදිවත පමණයි.

පාසල් යාමට පොත් පත් කිසිවක්ම නැත.

ගෙවල් දොරවල් කිසිම දෙයක් ජීවිත් වීමට නොමැත.



මුළු ගමේම ජීවිත බේරී ඇත්තේ ටොමියා නිසා ය. ටොමියාට කාටත් නොදැනුනු මේ විනාශ

ඉස්සෙල්ලම දැනුනේ ඌගේ ගබ්ද ඇසීමේ වේගය මිනිසුන් වන අපට වඩා වැඩි නිසා වෙනි.

මියුරුගේ පවුල සහ ගමේ අනෙක් පවුල් නැවතී සිටියේ රජයෙන් නවාතැන් දුන් අවතැන් කඳවුරකය.මෙය පාසලකි. මේ ජීවිතේ ඉතාමත් දුක්ඛිත විය.මියුරුට හා සියළු දෙනාටම ඒ වියසනය නිකං සිහිනයක් වගේ අතරමංව සිටින බවක් දැනෙයි.

මේ මිනිස්සුන්ගේ ජීවිත සති ගනන් , මාස ගනන් ගෙවී ගියේ මේ කදවුර තුළ ය.ඉතා අවාසනාවන්ත ඉරණමකි. මේ මිනිස්සුන්ට සියලු දේ අහිමි වී ඇත.



අහිංසක මිනිසුන් ඒ ගම දෙස බලා හූල්ලපු වාර අනන්තයි. මුළු සේසතම උදුරා ගත්තේ ඇයි කියලා අහනවා වගේ ය.

මේ අහිංසක මිනිසුන් ජීවිතය අලුතින් පටන් ගැනීමට හිත හයිය කර ගත්තේ පුංචි මියුරුගේ කතාව නිසාමයි.

අපිට හැමදේම නැති වුනත් ජීවිතය නැති වුනේ නෑනෙ.......

ඒ නිසා අපි ආයෙ ගමට යමු තාත්තේ......

වැටි වැටි නැගිටිමු.මොනවත්ම නැති වුනත් මමත් පාසල් ගිහින් හොඳට ඉගෙන ගන්නවා....

මේ නැති වුන සියලු දේ යළි ගොඩනඟමු.රටට හොඳ මිනිසුන් වෙමු.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)



# පසු වදන

අපේ රටේ 2025 නොවැම්බර් 28 වෙනිදා ඇති වූ දිට්වා  සුළි කුණාටුව පිළිබඳව මා සිතේ ඇති වූ කම්පනය මේ පොත ලිවීමට පාදක විය.

ගංවතුර, නාය යෑම්, ගෙවල්,  පාරවල්, පාසල්, ජීවිත හානි  මහා විනාශයකට මුහුණ දුන් අපේ රටේ අහිංසක මිනිසුන් විදි දුක, වේදනාව පුංචි මගේ සිතටත් හොඳින් ම දැනුණා.

එය මෙසේ කෙටියෙන් ලියන ලදී. මගේ පොත කියවීමෙන් මොන බාධක ආවත් නොවැටී අධිෂ්ඨානයෙන් ඉදිරියට ගියොත් ජීවිතය දිනිය හැකි බව ඔප්පු වේවි.

ISBN

918-624-211-454-5